දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර
மாவட்ட செயலகம் - களுத்துறை
DISTRICT SECRETARIAT – KALUTARA
" ඵලදායී හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් තුළින් විශිෂ්ඨත්වය කරා"
ISO 9001:2008

මගේ අංකය / எமது இல / My Ref. No	DSK/PLN/20/43/DO/Transfer	දිනය / திகதி / Date	2021.03.

12 MAR 2021

දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත,

<u>ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් 2021.02.12 දිනැතිව නිකුත් කරන ලද ස්වදේශ කටයුතු චක්‍රලේඛ 03/2021 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.(අදාල චක්‍රලේඛය මේ සමඟ අමුණා ඇත)

ඒ අනුව ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්තව ඔබ කාර්යාලයේ සේවය කරන සංවර්ධන නිලධාරීන් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු වලට යටත් වේ (වැය ශීර්ෂ 257 හා 409). මේ සබැඳිව අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු අතර, පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

- 2021.03.02 සිට 2021.06.01 අතර කාලය තුළ අන්‍යෝන්‍ය ස්ථාන මාරුවීම් අයදුම්පත් භාර නොගත යුතුය.
- මෙම ස්ථාන මාරුවීම් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ නිලධාරීන් සඳහා අදාල නොවේ.
- මේ වනවිට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති ස්ථාන මාරු නියෝග සඳහා මෙම චක්‍රලේඛය අදාල නොවේ.
- එකම සේවා ස්ථානයක අඛණ්ඩව වසර 02 ක් සේවය කරන ලද නිලධාරීන් අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලබයි.
- එකම සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් අනිවාර්ය ස්ථාන මාරුවලට යටත් වේ.
- දිස්ත්‍රික්කය තුළ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පිටත/දිස්ත්‍රික්කයෙන් පිටත ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.
- එකම සේවා ස්ථානයේ වසර 07 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පිටතට අනිවාර්යයෙන් ස්ථාන මාරු කළ යුතුය. (වසර 07 ට වඩා වැඩිනම් එකම කොට්ඨාශයේ වසම් වසම් අතර ස්ථාන මාරු සිදු කළ නොහැක)

දුරකථනය/Telephone ෆැක්ස්/Fax
දිස්ත්‍රික් ලේකම්
District Secretary
අධ්‍යක්ෂ (ඵලදායිතාදායක)
Directer Planning
034-2222508/2222235 034-2222635
034-3749490/2222621 034-2221529
Web – www.kalutara.dist.gov.lk E mail-ds@kalutara.dist.gov.lk , dpskalutara@yahoo.com

- අනිවාර්ය ස්ථාන මාරුවලට යටත් නිලධාරීන් නම් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා අයදුම් කිරීමට බැඳී සිටින බවට අදාල නිලධාරීන් දැනුවත් කළ යුතුය.

තවද චක්‍රලේඛයේ සඳහන් කාල සටහන අනුව අදාල කමිටු පිහිටුවා ස්ථාන මාරු අයදුම් පත් **2021.03.15** දිනට ප්‍රථම මා වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ගිනිගේ ප්‍රසන්න ජනක කුමාර
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
කළුතර පරිපාලන දිස්ත්‍රික්කය
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්